# පස්සෙන් පස්සට ගිය අශ්වයා

දවසක් දා රජ්ජුරුවන්ට ඕනෑ වුණා රජ උයනට ගිහින් ටිකක් විනෝද වෙන්න. එතුමාට අසු පිටින් තමන්ගෙ ප්‍රියතම අශ්වයා පිට යන්න ඕනෑ විත්තිය රජ්ජුරුවෝ ඇමතියන්ට කිව්වා.

රජවාසල ඉදිරිපිටට අශ්වයා ගෙනෙන කොට අන්දරෙත් ඒ ළඟ හිටියා. රජ්ජුරුවන් අශ්වයා පිට උඩට නඟිනවා අන්දරේ බලාගෙන හිටියා.

ඒත් සිද්ද වෙන්නෙ හරි ම පුදුම දෙයක්!

තෝන් ලණුව අතට අරන් රජ්ජුරුවන් අශ්වයව ඉස්සරහට පැදගෙන යන්න හැදුවත් අශ්වයා ඉස්සරහට නෙමේ යන්නෙ, පස්සට!

ඇමතිවරුයි, අශ්ව ගොව්වයි, රජවාසලේ අයයි දැන් මේ දිහා බලාගෙන ඉන්නවා. ඒ හැම කෙනෙක් ම වගේ අශ්වයා ඉස්සරහට පදවන්න හැදුවා. ඒත් කෝ - කිසි ම කෙනකුට ඒක කරන්න බැරි වුණා.

මේ සිද්ධ වෙන දේ අන්දරෙත් බලන් හිටියා. අන්දරේව දැකපු රජ්ජුරුවෝ ඔහුට කතා කළා.



"අන්දරේ, මේ අශ්වයා පැදගෙන මට උයනට යන්න ඕනෑ. ඒත් මූ ඉස්සරහට යන්නෙ නෑ නෙ. පේනවා නේ ද? අශ්වයා පිට මට උයනට යන ක්‍රමයක් හිතලා බලන්න."

අන්දරේ අශ්වයා ළඟට ගියා. ඔහු අශ්වයා හැරෙව්වා රජවාසල පැත්තට මුහුණලා හිටින්න. එතකොට අශ්වයගෙ වලිග පැත්ත හිටියෙ උයන තියෙන පැත්තට. දැන් අන්දරේ රජ්ජුරුවන්ට කිව්වා අශ්වයා පදවන්න කියලා.

රජ්ජුරුවන් තෝන් ලණුව ඇද්දා විතරයි අශ්වයා පස්සෙන් පස්සට ගියා රජ උයනට !

රජ්ජුරුවො සතුටු වුණා - අන්දරේ කොයි තරම් දක්ෂ ද කියලා හිතුවා. සතුට වැඩි කමට අන්දරේට තෑගිබෝග හුඟක් දුන්නා.